# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,287 — 1961 පෙබරවාරි 11 වැනි සෙනසුරාදා — 1961.2.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරණ ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ණය පත් ආඥා පණත

1947 සැප්තැම්බර් මස 24 වැනි දින නිකුත් කරන ලද අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රකාශයෙන් සංශෝධිත, ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ණය පත් ආඥා පනතේ (289 වැනි පරිච්ඡේදයේ) 4 වැනි වගන්තිය අනුව, මා වෙත පැවරී ඇති බලතල පරිදි, මුදල් ඇමතිවර පීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, මේ ආඥාවෙන්, 1959යේ අංක 18 දරණ ලංකා සංවර්ධන (සංශෝධන) ණය ආඥා පනතින් සංශෝධිත 1954රේ අංක 6 දරණ ලංකා සංවර්ධන ණය ආඥා පනතින් ණය මාර්ගයෙන් ගැනීමට බලය පවරන ලද රුපියල් කෝටි සියයෙන්, මෙහි පහත උප ලේඛනයෙහි නියමිත මුදල, එම උප ලේඛනයේ සඳහන් ක්‍රමයන් නියමයන් හා කොන්දේසි අනුව ලංකාව තුළ ණයට ගැනීමට විධාන කරමි.

පීලික්ස් ආර්. ඩයස් බණ්ඩාරනායක,
මුදල් ඇමති.

1961 පෙබරවාරි 8 වැනි දින, කොළඹ දීය.

### උප ලේඛනය

1. ණයට ගත යුතු මුදල රුපියල් 3,50,00,000කි. එය ලබා ගත යුත්තේ සම මිලට නිකුත් කරන අවුරුදු 21/25 ණය මුදල් වශයෙනි.

2. ණය මුදල ලබා ගත යුත්තේ ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් පමණකි.

3. ණය මුදල සඳහා ගෙවිය යුතු පොළිය වර්ෂයකට සියයට 4¼ කි.

4. ණය මුදල සඳහා සෑම වර්ෂයකම අර්ධ වාර්ෂික පොළිය ගෙවිය යුත්තේ, පෙබරවාරි මස 16 වැනිද හා අගෝස්තු මස 16 වැනි දිනවලය.

5. ණය බේරීම සඳහා පිහිටුවන නිදන් අරමුදලට, වර්ෂයකට සියයට 3තේ මුදලක්, ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් අර්ධ වාර්ෂිකව ගෙවිය යුතුය. මේ ගෙවීම ආරම්භ විය යුත්තේ 1962 පෙබරවාරි 16 වැනිදය.

6. ණය ලබා ගැනීම සඳහා නිකුත් කරන ලද ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු සඳහා මුදල් ආපසු ගෙවීමේ දිනය 1986 පෙබරවාරි 16 වැනිද විය යුතුය. එහෙත් 1982 පෙබරවාරි 15 වැනිදට පසු ඕනෑම දිනයක ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු සම මිලට ආපසු ගෙවීමට ආණ්ඩුවට ඉඩ ඇත. මෙසේ මුදල් ආපසු ගෙවීමේ දිනය මුදල් ඇමතිවරයා විසින් නියම කෙරෙන අතර, එම දිනයට හය මාසයකට නො අඩු කාලයකට පෙර ඒ බව ගැසට් පත්‍රයේ හා යටත් පිරිසෙයින් ලංකාවේ පළවන පුවත්පත් දෙකෙක දැන්වීම් මාර්ගයෙන් ප්‍රසිද්ධ කළ යුතුය.

---

### කාර්ය විස්තර පත්‍රිකාව

ව්‍යාපාර වස්තූන් සඳහා මුදල් භාර ගැනීමේ ලැයිස්තුව 1961 පෙබරවාරි 20 වැනි දින විවෘත කොට 1961 මාර්තු 20 වැනි දින වසා දමනු ලැබේ.

මුළු ණය මුදල ඊට පළමුව ලබා ගතහොත්, එම දිනයෙහිම මුදල් ලැයිස්තුව වසා දමනු ලැබේ

**ලබා ගන්නා ණය ප්‍රමාණය රුපියල් 3,50,00,000**

### ලංකාණ්ඩුවේ සියයට $4\frac{1}{4}$ ණය මුදල, 1982–86 "ආ" කාණ්ඩය

සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවනු ලැබේ

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාණ්ඩුව වෙනුවෙන් රුපියල් 3,50,00,000ක ණය මුදලක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. එයට ගෙවනු ලබන පොළී ප්‍රමාණය සියයට 4¼කි. ණය මුදල ආපසු ගෙවනු ලබන්නේ 1986 පෙබරවාරි 16 වැනි දය. නමුත්, හය මාසයක් කලින් දැනුම් දීමෙන් 1982 පෙබරවාරි 15 වැනිදට පසුව, ඕනෑම දිනයක ණය මුදල ආපසු ගෙවීමට ආණ්ඩුවට ඉඩ තිබේ. ණය ආපසු ගෙවන්නේ ද සම මිලටමය.

**ණය ලබා ගැනීමේ බලය.**—ණය මුදල ලබා ගන්නේ 1959යේ අංක 18 දරණ ලංකා සංවර්ධන (සංශෝධක) ණය ආඥා පනතින් සංශෝධිත 1954රේ අංක 6 දරණ ලංකා සංවර්ධන ණය ආඥා පනතින් ලත් බලයෙන් හා 1937තේ ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු හා ණය පත් ආඥා පනතේ (289 වැනි පරිච්ඡේදය) අඩංගු නීති යටතේය.

**අරමුණ.**—ලංකාවේ සංවර්ධනයට අදල වූ හෝ සම්බන්ධිත වූ ඕනෑම කාර්යයක් සඳහා වියදම් කිරීමට ණය මුදල් යොදවනු ලැබේ.

**නිකුත් කරන පිළිවෙළ.**—ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් ණය මුදල ලබා ගනු ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අරමුදල් පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් ලියා පදිංචි කළ ව්‍යාපාර වස්තු පිළිබඳව බලපවත්වන කොන්දේසි අඩංගු පත්‍රිකා ලබා ගත හැකිය.)

**ණය කොටසක මිල.**—ණය කොටසක මිල රුපියල් සියයට සියයකි. සම්පූර්ණ මුදල ඉල්ලුම් පත් ඉදිරි පත් කරන විට ගෙවිය යුතුය. අඩුම කොටස රුපියල් සියයකි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් 1961 පෙබරවාරි 20 වැනි ද සිට ණය මුදල් ලබා ගන්නා ලැයිස්තුව පියවනතුරු රෙජිස්ට්‍රාර් තැන විසින් භාර ගනු ලැබේ. ණයට මුදල් දීමේ ඉල්ලීම් නියමිත ඉල්ලුම් පත්‍රිකා වල එවිය යුතු අතර, ඊට ගෙවිය යුතු මුලු මුදල ඒ සමග එවිය යුතුය. ලංකා මුදල් ඉතිරිකිරීමේ බැංකුවේ හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරිකිරීමේ බැංකුවේ මුදල් තැන්පත් කරන්නන්ට ඒ ආයතන සමග කටයුතු පිළියෙළ කොට ඒවා මාර්ගයෙන් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැකිය.

බැංකුවලට ද (මුදල් ඉතිරිකිරීමේ බැංකුව හා තැපැල් කන්තෝරු මුදල් ඉතිරිකිරීමේ බැංකුව ඇතුලු) පිළිගත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට හා අවසර ලත් තැරැව්කරුවන්ට ද, ඔවුන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත් වෙනුවෙන් භාර ගත් නාමික ණය මුදල අනුව සියයට 1/16ක් කොමිස් වශයෙන් දෙනු ලැබේ. හුවමාරු ගාස්තු වශයෙන් නීතිඥවරුන්ට තමන්ගේ මුද්‍රාව දරණ ඉල්ලුම් පත්වල භාර ගත් ණය මුදල සම්බන්ධයෙන් ඒ ප්‍රමාණයේම කොමිස් ගෙවනු ලැබේ.

**ව්‍යාපාර වස්තු සඳහා ගෙවීම.**—" ලංකාණ්ඩුවේ ණය අරමුදල " යනුවෙන් හරස් රේඛිත කොට මහ බැංකුව වෙත ගෙවීමට අණ කරන චෙක් පතකින් මුදල් ගෙවිය යුතුය.

**ව්‍යාපාර වස්තු කොටස් සහතික පත්‍ර.**—ඉල්ලුම් පත් ලැබීමෙන් හා පිළිගැනීමෙන් පසු ව්‍යාපාර වස්තු සහතික නිකුත් කරනු ලැබේ.

**පොළිය.**—සෑම වර්ෂයකම අර්ධ වාර්ෂිකව පෙබරවාරි 16 වැනිද හා අගෝස්තු 16 වැනිද වසකට සියයට 4¼ බැගින් පොළී ගෙවනු ලැබේ. පළමුවෙන් පොළී ගෙවන්නේ 1961 අගෝස්තු 16 වැනි දය. ඒ පොළිය ගෙවනු ලබන්නේ ඉල්ලුම් පත් පිළිගත් දින සිට 1961 අගෝස්තු 15 වැනිද තෙක්, ඒ දිනය ද ඇතුලත් වන කාල සීමාව සඳහාය.

**අයබදු ගැනීම.**—(i) මුද්දර ගාස්තු.—ණය නිකුත් කිරීම, පවරා දීම හා ආපසු ගෙවීමාදියේ දී පාවිච්චි කරන සෑම ලියවිල්ලක් ම මුද්දර ගාස්තුවලින් නිදහස් ය.

(ii) ආදයම් බදු.—ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන්ට ආදයම් බදු අඩු නොකර පොළී ගෙවනු ලැබේ. නමුත්, ආදයම් බද්දට යටත්වන ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන් ආදයම් බදු සඳහා තමාගේ ආදයම් පෙන්වීමේ දී එම පොළිය ද අඩංගු කළ යුතුය. ලංකාවේ පදිංචි නොවූවන්ට පොළී ගෙවීමට පෙර ආදයම් බදු අඩු කර පොළී ගෙවනු ලැබේ. (දනට ආදයම් බදු ප්‍රමාණය, ලංකාවේ පදිංචි නොවූ පුද්ගලයන්ගෙන් සියයට 33⅓ක් ද, ධනය ඒකාබද්ධ වූ හින්දු පවුල්වලින් සියයට 39⅛ක් ද, පිට රට ලියා පදිංචි කළ සමාගම්වලින් සියයට 62½ක් ද වෙයි.) ලංකා ආදයම් බද්දෙන් නිදහස් අයට, අය කරනු ලැබූ ආදයම් බදු එම දෙපාර්තමේන්තුවෙන් ආපසු ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ.

(iii) ධන බද්ද.—1959යේ අංක 14 දරණ පුද්ගලික බදු පනතේ 6 (1) (ජී) වගන්තිය යටතේ ලංකාණ්ඩුවේ ණය පත්හි යොදන මුදල පුද්ගලයෙකුගේ ධනය වශයෙන් සලකනු නො ලැබේ. එබැවින් ඒවා ධන බද්දෙන් නිදහස් ය.

(iv) **බූදල් බද්ද.**—ලංකාණ්ඩුව විසින් නියම කෙරෙනු ලබන යම් යම් ව්‍යාපාර වස්තූන් වේද, ඒවා බූදල් බදු ගෙවීම සඳහා ආණ්ඩුව විසින් භාර ගනු ලැබේ. සම්පූර්ණ මුදල ගෙවූ සම මිලට නිකුත් කොට සම මිලට ආපසු ගෙවන ව්‍යාපාර වස්තූන්ගේ නාමික මිලත්, එයින් රැස්වන පොළියත්, ඒ සමාන බූදල් බද්දක් ගෙවීමට යෙදිය හැක. සම්පූර්ණ මුදල නො ගෙවූ හෝ අඩු මිලට නිකුත් කළ හෝ සම මිලට නොව වෙනයම් මිලකට ආපසු ගෙවෙන හෝ ව්‍යාපාර වස්තූන් සඳහා රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකිනුත්, එයින් උපදින පොළියෙනුත් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය වරින් වර ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවේ. නමුත් එවැනි රුපියල් සියයේ ව්‍යාපාර වස්තු කොටසකින් ගෙවිය හැකි බූදල් බදු ප්‍රමාණය, මුලින් ව්‍යාපාර වස්තුව නිකුත් කරන අවස්ථාවේ දී ගෙවූ මුදලත්, ව්‍යාපාර වස්තුව ආපසු ගෙවීමේ දී ගෙවෙන මුදලත් යන දෙක්හි අඩු මුදල යමක් වේ ද, එයට නො අඩු මුදලක් වේ. මුදලින් බූදල් බදු ගෙවීම වෙනුවට ව්‍යාපාර වස්තු මාර්ගයෙන් ගෙවීම කළ හැක්කේ එම ව්‍යාපාර වස්තූන් මුලින් නිකුත් කරන අවස්ථාවේ දී ම මියගිය තැනැත්තා විසින් මිලයට ගෙන තිබේ නම් හෝ මරණයට වසකට නො අඩු කාලයකට පෙර එම ව්‍යාපාර වස්තූන් මිලයට ගෙන තිබේ නම් හෝ පමණකි.

**සුරක්ෂිතතාවය.**—ණය මුදල් ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ආරක්ෂා වී ඇත. ණය ගෙවීමේ අරමුදල්හි භාරකරුවන් වන මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙහි පාලනය යටතේ ණය මුදල් බේරීම් සඳහා වෙන් වූ නිදන් අරමුදලක් පිහිටුවනු ඇත. වර්ෂයකට සියේට 3නේ ප්‍රමාණය අනුව 1962 පෙබරවාරි 16 වැනිද සිට නිදන් අරමුදලට අර්ධ වාර්ෂික ගෙවීම් පටන් ගනු ලැබේ.

**ආණ්ඩුවේ ණය මුදලේ ප්‍රමාණය.**—දනට ලංකාණ්ඩුවේ දළ සදහන ණය ප්‍රමාණය රු. 1,459,525,500 කි. ණය බේරීම් සඳහා වෙන් වූ නිදන් අරමුදලෙහි ආසන්න වෙළෙඳ වටිනාකම රු. 285,955,252 කි. එම නිසා ආණ්ඩුවේ ඉතිරි ශුද්ධ ණය මුදල රු. 1,173,570,248 කි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන්, වාණිජ බැංකුවලින්, කච්චේරිවලින්, තැපැල් කාර්‍යාලවලින් හෝ ජාතික මුදල් ඉතිරිකිරීමේ ව්‍යාපාරයේ කොමසාරිස්වරයාගේ කාර්‍යාලයෙන් ද ලබා ගත හැකිය.

ඕ. බී. ගුණවර්ධන,
රෙජිස්ට්‍රාර් තැන.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 1149,
කොළඹ 1,
1961 පෙබරවාරි 11 වැනි දින දීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරණ ලදී.